# උතුම්ම පොරොන්දු





දෙවියන්වහන්සේ කර ඇති උතුම්ම පොරොන්දුව හා
එම පොරොන්දුව ඉටු කිරීමට දෙවියන්වහන්සේ
කල දේ ගැන මෙම පොත පවසයි.



දෙවියන්වහන්සේ ප්‍රේම කරන සේක.
උන්වහන්සේ තම පොරොන්දුව ඉටු කරන සේක.

දෙවියන්වහන්සේ ලෝකය මැවූ දා පටන් සකල ජනතාවට ප්‍රේම කර
ඔවුන් ගැන සැලකිලිමත් වන බව උන්වහන්සේ පොරොන්දුවූ සේක.

සමහර විට මනුෂ්‍යයන් තම පොරොන්දු ඉටු නොකරයි... නමුත්
දෙවියන්වහන්සේ පොරොන්දුවක් වූ විට එය ඉෂ්ඨ කරන සේක !





## මනුෂ්‍යයන් වැරදි කරමින් තම පොරොන්දු කඩ කරති :

- ඔවුන් දෙවියන්වහන්සේව අමතක කරති.
- ඔවුන් දෙවියන්වහන්සේට අකීකරු වෙති.
- ඔවුන් එකිනෙකා වේදනාවට පත් කරති.

උන්වහන්සේ පැවසුවේ අප කරන්නාවූ වැරදි වලට ලැබෙන දඬුවම නම් අපට උන්වහන්සේ සමඟ එකට ජීවත් වීමට නොහැකි බවයි.

---

පාපය : දෙවියන්වහන්සේ බයිබලය තුළින් අපට කරන්න, සිතන්න, පවසන්න එපා කියන දේ කිරීමය.

"මක්නිසාද සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති."
(රෝම 3 : 23)





## යේසුස්වහන්සේ එවා තම පොරොන්දු ඉටු කල සේක :

දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට ප්‍රේම කරන බවටවූ පොරොන්දු උන්වහන්සේ කිසිදා කඩ නොකල සේක. උන්වහන්සේ මනුෂ්‍යයන්ට කෙතරම් ප්‍රේම කලසේක්ද යත් : උන්වහන්සේ තම පුත්‍රයාණන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මනුෂ්‍යයන් සමඟ ජීවත් වීමට හා දෙවියන්වහන්සේ ප්‍රේමය මනුෂ්‍යයන්ට ප්‍රකාශ කරන පිණිස එවූ සේක.

යේසුස්වහන්සේ දරුවෙක් මෙන් පැමිණි සේක. උන්වහන්සේ කවුරුන්දැයි දැන සිටියේ ස්වල්ප දෙනෙක් පමණි. ...
උන්වහන්සේ නම් ගැළවුම්කරුවාණන්වූ, දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්වහන්සේය.

---

ගැළවුම්කරුවාණෝ : මනුෂ්‍යයන්ව තම වචනයෙන්ද, ක්‍රියාවෙන්ද, ඇදහිල්ලෙන්ද, කරන සියළු පාපයන්ගෙන් ගලවන්නට සහ මුදාගන්ට හැකි එකම පුද්ගලයා නම්, යේසුස්වහන්සේය.

"අප කෙරෙහි තිබෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරනු ලැබුවේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් කරණකොට ගෙන අප ජීවත්වන පිණිස උන්වහන්සේ ලෝකයට එවූ කාරණයෙන්ය."
(1 යොහාන් 4 : 9)





යේසුස් වහන්සේ මනුෂ්‍යයෙකු ලෙස නිරූපණය වූ සේක. උන්වහන්සේට හමුවූ සියල්ලන්ටම තම පියාණන්වූ දෙවියන්වහන්සේ ගැන පැවසුසේක.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට ප්‍රේම කරන බවට වූ පොරොන්දුව ගැන යේසුස් වහන්සේ මනුෂ්‍යයන්ට පැවසූ සේක.

දෙවියන් වහන්සේටත්, එකිනෙකාටත් ප්‍රේම කල යුත්තේ කෙසේදැයි, යේසුස් වහන්සේ තම ජිවිතයෙන් පෙන්වූ සේක.

නිතරම කුඩා ළමුන් බැලිමට උන්වහන්සේ වේලාව ගත් සේක.

නුමුත් යේසුස්වහන්සේ ඔවුන් තමන් ලගට කැඳවා : ළදරුවන් නොවලක්වා මා ලගට එන්ට ඉඩ හැරපල්ලා, මක්නිසාද, දෙවියන්වහන්සේගේ රාජ්‍ය මෙබඳු වන්ගේය.
( ලූක් 18 : 16 )





නමුත් බොහෝ අය දෙවියන්වහන්සේට ප්‍රේම නොකල අතර, ඔවුන් යේසුස් වහන්සේ මරණයට පත් කලේය.

මනුෂ්‍යයා කල සියළුම පාපයන් වලට දඬුවම තම කරපිට ගන්නා පිණිස උන්වහන්සේ ඔවුන්ට ඉඩ හැරිය සේක.

**යේසුස් වහන්සේ දිවි පිදූ සේක.**

ඔබ හා මා වැනි සියළුම දෙනාගේම සියළු පාප වලට සමාව ලබා ගෙන දෙවියන් වහන්සේ සමග දැන් හා සදහටම මිත්‍රත්වයක් ඇතිව ජීවත් වන පිණිස යේසුස් වහන්සේ දිවි පිදූ සේක.

යේසුස් වහන්සේ දිවි පිදුවේ ඔබට මහත්සේ ප්‍රේමකල නිසාය.

---

සමාව දීම : සිතුවිල්ලෙන් හෝ ක්‍රියාවෙන් කල වැරැද්දට සුදුසු දඬුවම ඉවත් කිරීමට හෝ නිදහස් කිරීමට තීරණයක් ගැනීම සමාව දීමය.

විශ්වාසය තැබීම : යමෙක් මත යැපීම හෝ යම් දෙයක් කෙරෙහි ඇති ස්ථිරතාවය හෝ ඔබ විශ්වාස කරන දේ අනුව ක්‍රියා කිරීමය.

මක්නිසාද, දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නා සැමදෙනම විනාශ නොවී සදා කාල ජීවනය ලබන පිණිසය.
( යොහාන් 3 : 16 )





යේසුස් වහන්සේ දිවි පිදූ විට දෙවියන්වහන්සේගේ පොරොන්දුව
අවසන් නොවූ සේක.
අනර්ඝම කොටස තවම පැමිණ නැත.

දෙවියන්වහන්සේ යේසුස් වහන්සේව මළවුන්ගෙන් උත්ථානය කලසේක.
බොහෝ දෙනෙකු උන්වහන්සේ දැක හා උන්වහන්සේ සමග
කථාකල සේක.

## යේසුස් වහන්සේ නැවත නැගිටි සේක.

උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථානය වුයේ උන්වහන්සේ
දෙවියන්වහන්සේ බව පෙන්වන පිණිසය.
පව්කිරීම නතර කොට, දෙවියන්වහ්නසේ කැමති
ආකාරයට ජිවත්වීමට ඔබට උපකාර කිරීමට
උන්වහන්සේට බලය ඇති බව පෙන්වීමටය.

මා ආවේ ඔවුන්ට ජිවනය ලැබෙන
පිණිසත් එය අධික ලෙස ලැබෙන
පිණිසත්ය. ( යොහාන් 10 : 10 )





දෙවියන්වහන්සේ සමග සිටින පිණිස යේසුස් වහන්සේ පැමිණ නැවත ගිය සේක.

යාමට ප්‍රථම උන්වහන්සේ වෙනත් පොරොන්දු දුන් සේක.

- ඔබට උන්වහන්සේ දැක ගැනීමට නොහැකි වුවත් යේසුස් වහන්සේ ඔබ සමග සිටින බවට පොරොන්දුවූ සේක.
- යේසුස් වහන්සේ ඔබගේ හොඳම මිතුරා වීමට පොරොන්දුවූ සේක.
- යේසුස් වහන්සේ ඔබ කල සියළුම පාප වලට සමාව දීමට පොරොන්දුවූ සේක.
- යේසුස් වහන්සේ ඔබ තුල සිටිමට පොරොන්දුවූ සේක.
  ...... ඔබට ප්‍රේමය ලැබෙන විටත්, වේදනාවට පත්වන විටත්
  ...... ඔබට ප්‍රිතිය ලැබෙන විටත්, දුකට පත්වන විටත්
- ඔබ මිය ගිය විට උන්වහන්සේ සමග සදාකාලයටම ජිවත් වීමට ඔබට පුළුවන් බව උන්වහ්නසේ පොරොන්දු වූ සේක.

යේසුස් වහන්සේට ඔබ තුලට පැමිණෙන්න ආරාධනා කරන්න ඔබ කැමතිද ?

මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටින්නෙමියි කීසේක.
( මතෙව් 28 : 20 )
මක්නිසාද: මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි,
( හෙබ්‍රෙව් 13 : 5 )





## දෙවියන්වහන්සේට කථා කරන්න.

ඔබගේම වචනයෙන් හෝ මෙවැනි යාච්ඤාවක් තුලින් :

" ආදරණීය දෙවියන්වහන්ස, යේසුස් වහන්සේ ඔබගේ පුත්‍රයාණන් බව මම විශ්වාස කරමි. මා කල සියළුම පව් නිසා කුරුසියේ දිවි පිදිම ගැන මම ස්තුති කරමි. මා කල සියළු පව් නිසා කුරුසියේ දිවි පිදිම ගැන මම ස්තුති කරමි. මට අනුකම්පා කර මා කල සියළු පාපයන්ට මට සමාව දුන මැනව. මා සමග සැම මොහොතකම සිටින පිණිස යේසුස් වහන්ස මා ඔබට ආරාධනා කරමි. ඔබ කැමති ආකාරයේ පුද්ගලයෙකු ලෙස ජිවත්වීමට මා හට උපකාර කල මැනව. මගේ යාච්ඤාවට පිළිතුරු දුන් නිසා ඔබට ස්තුතියි "

ඔබ දැන් මෙම යාච්ඤාව කිරිමට කැමතිද ?
දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන බවටත්, උන්වහන්සේ ඔබ සමග සිටින බවටත් දෙවියන්වහන්සේ වු පෙරොන්දුව ගැන විශ්වාස කරන්න.

---

යාච්ඤාව : යාච්ඤාව නම්, දෙවියන්වහන්සේට නිහඬව හෝ ශබ්ද නගා කථා කිරීමය.

නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගත්තෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක.
( යොහාන් 1 : 12 )





ඔබ දෙවියන් වහන්සේගෙන් සමාව ඉල්ලා,
යේසුස් වහන්සේට ඔබ සමග සිටින පිණිස ආරාධනා කල විට ......
උන්වහන්සේ සැබවින්ම ඔබ සමග හා ඔබ තුල දැන් හා
සදාකාලයටම සිටින සේක.

ඔබට උන්වහන්සේ දැකිය නොහැක.
ඔබට කිසිදු වෙනසක් නොදැනෙන්නට පුළුවන.
නමුත් යේසුස් වහන්සේ සැබවින්ම ඔබ සමග සිටින සේක.
එසේ සිටිමට උන්වහන්සේ පොරොන්දුවූ සේක .......
උන්වහන්සේ සැම විටම තම පොරොන්දු ඉටු කරන සේක.

ඔබ සමග සිට, ඔබගේ ජිවිතය ගත කිරීමට උපකාර කිරීම ගැන
දිනපතා ස්තුති කරන්න.

---

ඇදහිල්ල : අපට තේරුම් ගත නොහැකි
දේ ගැන විශ්වාස කිරිමය.
ඔබට හැගුනත් නැතත් දෙවියන්වහන්සේගේ
පුත්‍රයාණන් කෙරෙහි හා උන්වහන්සේගේ පොරොන්දු
කෙරෙහි විශ්වාසය තැබිමය.

" මක්නිසාද නුඹලා සියල්ලෝම
ක්‍රිස්තුස්යේසුස්වහන්සේ තුල
ඇදහිල්ල කරණකොට ගෙන
දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. "
( ගලාති 3 : 26 )





ඔබ යේසුස්වහන්සේට ඔබ තුලට පැමිණීමට ආරාධනා කල පසුවත්,
සමහර මොහොත් වල ඔබ කෙනෙකුට අකාරුණික වියහැක.
නැතහොත්, අකීකරු වියහැක. ඔබ ආත්මාර්ථකාමි
සිතුවිලි සිතන්නට පුළුවන.

වැරදියි කියා ඔබ සිතන යම් දෙයක් කල විට,
දෙවියන්වහන්සේට කථා කරන්න.
ඔබ කලදේ හෝ සිතුදේ උන්වහන්සේ ඔබෙන්
බලාපොරොත්තුවුදේ නොවන බව පිළිගන්න.

ඔබට සමාව දිම ගැන, දෙවියන්වහන්සේට
ස්තුති කරන්න.

---

පාපොච්චාරණය : දෙවියන්වහන්සේට සත්‍යය පැවසිම,
ඔබ කලදේ හෝ සිතුදේ හෝ පැවසුදේ,
උන්වහන්සේ අකමැති දේ බව පිළිගන්න.

අපේ පාපවල් කියා දෙමු නම්
අපේ පව් අපට කමා කරන්ටත්
සියලු අධර්මිෂ්ඨ කමින් අප
පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ
විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක.
( 1 යොහාන් 1 : 9 )

දෙවියන් වහන්සේ තවත් බොහෝ පුදුමාකාර පොරොන්දු දුන්සේක. යේසුස් වහන්සේ සමග ඇති ඔබගේ අළුත් ජීවිතය වර්ධනය වීමට උපකාර කිරීමට පොරොන්දුවූ සේක.





ඔබට දෙවියන්වහන්සේගේ පොරොන්දු ගැන දැන ගැනිමට පුළුවන්
................ මෙම පොරොන්දු ඇති බයිබල් පද කියවීමෙන්,
................ යේසුස් ගැන උගන්වන්නාවු ස්ථාන වලට යෑමෙන්,
................ යේසුස් වහන්සේට දිනපතා කතා කිරීම තුලින්,

ඔබ යේසුස් වහන්සේ ගැන ඉගෙන ගත් දේ පිළිබඳව ඔබගේ පවුලේ අයට සහ මිතුරන්ට පැවසිය හැකියි.
ඔබ, මෙම පොත ඔවුන්ට කියවා දි, ඒ තුලින්, දෙවියන් වහන්සේගෙන් සමාව අයදිමට උපකාර කරන්න. යේසුස් වහන්සේ,
ඔවුන් තුල හා ඔවුන් සමග සිටින පිණිස ඔබට ආරාධනා කල හැකියි.


සැම විටම උන්වහන්සේ පොරොන්දුවූ දේ කරන බවට විශ්වාසය තබන්න .......
උන්වහන්සේ පැවසූ ආකාරයෙන්ම ඒ දේ කරන සේක.

**මගේ පොරොන්දුව ............**

අද මා ඉල්ලා සිටින විට, මා කල
වැරදි වලට දෙවියන්වහන්සේ කමාවු සේක.
දැන් යේසුස් වහන්සේ මා සමග හා මා
තුල සිටින සේක.
දෙවියන්වහන්සේ වැනි පුද්ගලයෙකු වීමට
මට අවශ්‍යයි.
මට දෙවියන්වහන්සේටත්, අන් අයටත්
ප්‍රේම කිරීමෙන් වර්ධනය වීමට අවශ්‍යයි.

මගේ නම : ..................................................

දිනය : ..................................................



Written by Vernie Schorr

Sinhalese

©1990 The JESUS Film Project
Reprinted by Foursquare Missions Press with permission.

Bible Verses in this book worded for ease of understanding.

Pictures in this booklet used by permission of The JESUS Film Project and taken from "JESUS," a 2-hour film on the life of Christ. For more information on "The Story of Jesus for Children" video or additional material, contact: The Story of Jesus for Children, 910 Calle Negocio, Ste. 160, San Clemente, CA 92673, USA, 1-800-432-1997, www.jesusforchildren.org